දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**

**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/7/1/29/2/2012

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.08. 20

ලේකම්

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ අධි පන්තියේ නිලධර ගණය (MN-07-2016) සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක ED/10/NH/02/01/05-18 හා 2019.05.06 දිනැති ලිපිය හා බැඳේ.

02. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ අධි පන්තියේ නිලධර ගණය (MN-07-2016) සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියට, මේ සමඟ අමුණා ඇති ඇමුණුමේ සඳහන් සංශෝධනය ඇතුලත් කර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.08.07 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. තවද, එම බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2012.12.10 දින සහතික කර ඇති බැවින්, නැවත සහතික කිරීමක් අවශ්‍ය නොවන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරන ලද සංශෝධනය සටහන් කර ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්. ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත:

1. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල් - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

<u>සංශෝධන ලැයිස්තුව -</u>

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංකය</th><th colspan="2">යෝජිත සංශෝධනය</th></tr>
<tr><td>1.</td><td>ප්‍රධාන මාතෘකාව</td><td colspan="2">“පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධි පන්තිය සේවා ගණය (MN 07) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය” ලෙස සංශෝධනය කරන්න</td></tr>
<tr><td>2.</td><td>නිලධර ලෙස සඳහන්ව ඇති සියළුම ස්ථාන</td><td colspan="2">“නිලධර” යන්න “සේවා” ලෙස සංශෝධනය කරන්න.</td></tr>
<tr><td>3.</td><td>1.1</td><td>යොමු අංකය: පු.වි./1/17/බ.ගැ.පටිපාටි(v) දිනය: 2019.02.13</td><td rowspan="5">මෙම අනු අංක යටතේ ඇතුලත් කරුණු වලට අමතරව මෙහි සඳහන් යොමු අංක හා දිනයන් ඇතුලත් කරන්න</td></tr>
<tr><td>4.</td><td>1.2</td><td>යොමු අංකය: ED/10/NH/02/01/5-18 දිනය: 2019.05.06</td></tr>
<tr><td>5.</td><td>1.4</td><td>යොමු අංකය : EST-2/RECRU/02/0223 දිනය : 2018.10.05</td></tr>
<tr><td>6.</td><td>1.5</td><td>යොමු අංකය : NSCC/5/31/72/SR දිනය : 2019.01.03</td></tr>
<tr><td>7.</td><td>1.6</td><td>යොමු අංකය : PSC/EST/7/1/29/2/2012<br>පළමුවන සංශෝධන අනුමත දිනය : 2014.03.25<br>දෙවන සංශෝධන අනුමත දිනය : 2019.08.</td></tr>
<tr><td>8.</td><td>3.1</td><td colspan="2">සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය</td></tr>
<tr><td>9.</td><td>3.3 ට පසුව</td><td colspan="2">“3.4 කාර්යයන් පැවරීම-<br>ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.”<br>ලෙස ඇතුලත් කරන්න.</td></tr>
<tr><td>10.</td><td>5.1</td><td colspan="2">වැටුප් කේත අංකය : - MN- 07 - 2016</td></tr>
<tr><td>11.</td><td>5.2</td><td colspan="2">වැටුප් පරිමාණය :- රු 41,580 – 11 X 755 – 18 X 1030 - රු 68,425/=</td></tr>
<tr><td>12.</td><td>5.3</td><td colspan="2"><table><tr><th>ශ්‍රේණිය</th><th>ආරම්භක වැටුප් පියවර</th><th>වැටුප් තලය (රු)</th></tr><tr><td>විශේෂ</td><td>පියවර 04</td><td>43,845/-</td></tr></table>සටහන :- 2016.01.01 සිට 2020.01.01 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 උපලේඛන II හි සඳහන් පරිදිය</td></tr>
</table>

<table>
<tr><td>13.</td><td>7.1</td><td>බඳවා ගන්නා ප්‍රතිශතයන් ලෙස සංශෝධනය කරන්න.<br>
<table>
<tr><td>ධාරාව</td><td>ප්‍රතිශතයන්</td></tr>
<tr><td>විවෘත</td><td>අදාළ නොවේ</td></tr>
<tr><td>සීමිත</td><td>40%</td></tr>
<tr><td>සේවා පළපුරුද්ද හා කුසලතා</td><td>60%</td></tr>
</table>
සටහන :<br>
විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේ දී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ය.<br>
I. අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් වන විට සීමිත තරඟ විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.<br>
II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 3කට වඩා අඩු වේ නම් නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදුකළ යුතුය.</td></tr>
<tr><td>14.</td><td>7.2</td><td>විවෘත බඳවා ගැනීම - අදාළ නොවේ.</td></tr>
<tr><td>15.</td><td>7.3.2.3</td><td>අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN – 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ම උපයාගෙන තිබීම.</td></tr>
<tr><td>16.</td><td>7.3.2.4</td><td>සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තවිය යුතුය.</td></tr>
<tr><td>17.</td><td>7.3.2.5</td><td>I. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>
II. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 සේවාගණයෙහි 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාව හදාරා තිබිය යුතු යි.<br>
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.</td></tr>
<tr><td>18.</td><td>7.3.3</td><td>වයස- අදාළ නොවේ.</td></tr>
<tr><td>19.</td><td>7.3.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය : සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ</td></tr>
<tr><td>20.</td><td>7.3.4.1</td><td>ලිඛිත විභාගය -<br>
<table>
<tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. අභියෝග්‍යතා පරීක්ෂණය</td><td>100%</td><td>40%</td></tr>
<tr><td>2. කළමනාකරණය</td><td>100%</td><td>40%</td></tr>
</table>
(මෙම විභාගයේ විෂය නිර්දේශය ඇමුණුම 01හි දැක්වේ.)<br>
සටහන:<br>
I. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාළ</td></tr>
</table>

<table>
<tr><td>30.</td><td>7.4.2.5</td><td>I. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයන් පෙන්නුම් කර තිබීම.<br>III. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 සේවා ගණයෙහි 3 වැ. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාව හදාරා තිබිය යුතු යි.<br>IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.</td></tr>
<tr><td>31.</td><td>7.4.3</td><td>වයස - අදාළ නොවේ.</td></tr>
<tr><td>32.</td><td>7.4.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබාදෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.</td></tr>
<tr><td>33.</td><td>7.4.4.3</td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ; - අදාල නොවේ<br>යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ</td></tr>
<tr><td>34.</td><td>7.4.4.4</td><td>යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය
<table>
<tr><th>ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>සේවා පළපුරුද්ද</td><td>50</td><td rowspan="4">අදාළ නොවේ</td></tr>
<tr><td>කුසලතාවය</td><td>45</td></tr>
<tr><td>සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය</td><td>05</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td>100</td></tr>
</table>
සටහන :<br>1. එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු ලබාදීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කරනු ලැබේ.<br>2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදි ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.</td></tr>
<tr><td>35.</td><td>7.4.4.4.1</td><td>පවත්වන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්</td></tr>
</table>

| | | |
|---|---|---|
| 36. | 7.4.5 | **“රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පලකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.” ලෙස සංශෝධනය කරන්න** |
| 37. | 8 | කාර්යක්ෂමතා කඩඉම - අදාළ නොවේ |
| 38. | 9 | භාෂා ප්‍රවීණතාවය - අදාළ නොවේ |
| 39. | 10 | ශ්‍රේණි උසස් කිරීම - අදාළ නොවේ |
| 40. | 11 | තනතුරට පත් කිරීම - අදාළ නොවේ |
| 41. | 12 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන කොන්දේසි අදාළ වේ. |
| 42. | 13 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිභාහිර වන්නා වූ අර්ථ නිරූපණ<br><br>**“සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන , එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.” ලෙස ඇතුලත් කරන්න** |
| 43. | 14 | ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය - ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව සිදුවිය යුතුය |
| 44. | 15 | සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැතිඅතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. |
| 45. | 16 | “මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ” |
| 46. | 17 | අන්තර්කාලීන විධිවිධාන - ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව සිදුවිය යුතුය |